# පරිසර හිතකාමී ප්‍රතිමාන ප්‍රවර්ධනයෙහිලා වස් සමාදානයේ උපයෝගීතාව

පින්නවල සංඝසුමන හිමි

## හැඳින්වීම

පාලි භාෂාවේ එන වස්සාන යන්නෙහි සිංහලාර්ථය 'වස්' වශයෙන් ව්‍යවහාරයට එයි. වැස්ස, වැසි කාලය හෝ වර්ෂාව බහුල ඍතුව 'වස්සාන' යන්නෙන් පෙළෙහි අර්ථ දැක්වේ. සමාදන්වීම හෙවත් විසීම යන පදය තුළ එකඟකම, සමාධිය, අවිරෝධතාව, එකමුතුකම, සමගිය ආදී අර්ථ පවතී. විනය ප්‍රතිපදාව නම් සන්දර්භය තුළ මෙය විග්‍රහ කරනවිට කිසියම් ශික්ෂා මාර්ගයක් උදෙසා ඇතිකර ගන්නාවූ එකඟකම හෝ සමාධිය වශයෙන් එයට පුළුල් අර්ථයක් ලැබේ. ඒ අනුව වැසි ඍතුව පවතින කාලය පුරා කිසියම් ප්‍රතිපදාවකට අනුගතවීම හෙවත් සමාධිගතවීම වස් සමාදන්වීම වශයෙන් හැඳින්විය හැකිය. බුදුරජාණන් වහන්සේ විසින් වස් සමාදන්වීම පිළිබඳ ව පනවන ලද විනය ප්‍රතිපදාව පිළිබඳ පසුබිම් විස්තරය මහාවග්ග පාළියේ වස්සූපනායිකක්ඛන්ධකයේ දැක්වෙයි. බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ වසන සමයෙක භික්ෂූන් පිරිසක් තමන් විසින් ලබන ලද අත්දැකීමක් බුදුරදුන් අභිමුවෙහි තැබූහ.

> 'ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස මනුෂ්‍යයෝ බුද්ධශ්‍රාවක සංඝයාට එරෙහිව චෝදනා කරති. හඬ නගති. උද්ඝෝෂණය කරති. කුමක් පවසමින් චෝදනා කරන්නේ ද යත් "වැසි කාලය එළඹි කල්හි කුරුල්ලන් සිවුපාවුන් ආදී සතුන් පවා සිය කූඩුවලට වී සිටිති. ආහාර සොයා යන්නටවත් බැහැර වන්නේ නැත. එහෙත් ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ හේමන්තයේත් චාරිකාවේ හැසිරෙති. ගිම්හානයේත් චාරිකාවේ හැසිරෙති. හරිත පැහැ ගැන්වුණු තණ පාගා දමති. කුඩා ප්‍රාණීන් පාගා දමති" යනුවෙනි'.

බුදුරජාණන් වහන්සේ එයට මෙසේ පිළිවදන් දුන්හ.

අනුජානාමි භික්ඛවෙ වස්සං උපගන්තුන්ති.

මහණෙනි මම වස් එළඹීම අනුදැන වදාරමි.

*කදා නු ඛො වස්සං උපගන්තබ්බං.*

කවර කලෙක වස් එළඹිය යුතුද ස්වාමීනි?

*අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගන්තුන්ති.*

මහණෙනි වැසි සෘතුවෙහි වස් එළඹීම අනුදැන වදාරමි.

මෙසේ වස් සමාදන්වීම අනුදැන වදාළ බුදුරජාණන් වහන්සේ එය තවදුරටත් තහවුරු කරමින් වස් සමාදන් නොවී සිටීම ඇවැතක් යැයි පෙන්වා දුන්හ (*ආපත්ති දුක්කටස්සාති*). එතුළින් මතුව පෙනෙන්නේ උන්වහන්සේ මේ කෙරෙහි කෙතරම් උනන්දුවක් දක්වා තිබේද යන්නයි. සෑම උපසපන් භික්ෂුවක් විසින් ම අනුගමනය කළ යුතු යැයි අනුදැන වදාළ මේ වස් එළැඹීම එදා මෙදා තුර බෞද්ධ සංස්කෘතියේ ඉතා වැදගත් ස්ථානයක් හිමිකරගෙන තිබේ. මේ ඇසුරින් බිහි වී ඇති වස් ආරාධනාව, වස් පූජා, කඨින පෙරහැර, කඨිණ චීවර පූජාව, කඨිණානිසංස ධර්ම දේශනා ආදී විචිත්‍රවත් ආගමික හා සංස්කෘතිකාංග රැසක් ලාංකේය හා ලෝක බෞද්ධ සංස්කෘතිය තුළ දැකිය හැකිය.

බුදුරජාණන් වහන්සේ වස් සමාදන්වීම අනුදැන වදාළේ සැබවින් ම ඉහත කී පිරිදි පොදු ජනතාවගෙන් නැගී ආ විරෝධතාව නිසා ම පමණක් නොවේ. ඉතා සූපරීක්ෂාවෙන් විමසන කල්හි පෙනෙන්නේ වස් සමාදන්වීමේ ඇති වැදගත්කම ඉන් ඔබ්බට ගිය ඉතා වැදගත් කරුණු රැසකින් පෝෂිත බවෙකි. එබැවින් වස්සාන සෘතුවට පමණක් සීමා වූ විනය ප්‍රතිපදාවක් පමණක් ය යන අදහසින් ඔබ්බට ගොස් එතුළින් පිළිබිඹුවන සර්වකාලීන පාරිසරික හා සමාජ වටිනාකම මතකර ගනිමින් සමස්ත සමාජය තුළ පරිසර හිතකාමී ප්‍රතිමාන (Eco-friendly Norms) වර්ධනය කිරීමට එය කෙතෙක් දුරට ඉවහල් කරගත හැකිද යන්න විමසීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වෙයි. තවද සමාජ ජීවිතය තුළ ගොඩනැගෙන ආගමික අභිප්‍රේරණය උදෙසා වස් විසීමේ ඇති වැදගත්කම අවධාරණය කිරීමත්, මිනිසා, පරිසරය හා ආගම අතර පවත්නා අන්‍යොන්‍ය සම්බන්ධතාවයේ විචිත්‍රත්වයත් එහි සමාජ



අර්ථයත් හඳුනා ගනු පිණිස බුද්ධ දේශනාවේ දැක්වෙන විවිධ සංකල්ප භාවිතයට ගැනීම තුළින් වස් සමාදන්වීම අනුදැනීම තුළ බුදුරජාණන් වහන්සේ අපේක්ෂා කළ පරිසර හිතකාමී ආධ්‍යාත්මික ගුණධර්ම භාවිතයට ගතහැකි ආකාරය පිළිබඳ මග පෙන්වීමක් මෙම ලිපියෙන් සැපයේ.

**පාරිසරික හා සමාජ සාධක සමග බැඳුණු වස් සමාදානය**

සමස්ත ඉන්දියානු භූමියෙන් හතරෙන් පංගුවකටත් වඩා පැතිරී පවතින ගංගා නදී ද්‍රෝණිය බුද්ධ කාලයේ නගර ගම් නියම් ගම් පැතිර පැවැති ජනාකීර්ණ ප්‍රදේශයකි. එය සාරවත් කරන බටහිර හිමාලයෙන් ඇරඹී කි.මී. 2525 ක් පමණ දුරක් ගලා යන ගංගා නදිය අදටත් පූජනීයත්වයෙන් සලකන එකකි. වර්තමානයේ ගංගාව අසබඩ දක්නට ලැබෙන නව දිල්ලිය, අග්‍රා, පැට්නා සහ කල්කටා ආදී නාගරික ප්‍රදේශ මෙන් ම බාරාණසී හරද්වාර් අලහබාද් ආදී පූජනීය නගර ද සහිත වර්ග කි.මී. මිලියනයකටත් වැඩි වපසරියක් සහිත මෙම ජනාකීර්ණ පහත් මිටියාවත් ප්‍රදේශය බුදුන් දවස සොළොස් මහා ජනපදවලට අයත්ව පැවතිණි. මෙම කලාපයේ විවිධ ස්ථානයන්හි වැඩ විසූ බුදුරජාණන් වහන්සේට එහි කලින් කලට ඇති වූ පාරිසරික වෙනස්වීම් පිළිබඳවත් එයට අනුකූලව ආර්ථික හා සමාජ ජීවිතය ගොඩනැගී තිබූ ආකාරය පිළිබඳවත් මහත්වූ අවබෝධයක් පැවැති බවට සැකයක් නැත. කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයට අනුව ඉන්දියාව උප දේශගුණ වර්ග හයකින් සමන්විතය. නිවර්තන මෝසම් දේශගුණයක් සහිත එහි භූ විෂමතාව, භූමියේ විශාලත්වය, හිමාලය කඳුවැටියේ පිහිටීම සහ කලින් කලට ඇතිවන සුළං ප්‍රවාහ නිසා වසර පුරා කැපී පෙනෙන සෘතුගත රටාවක් ද දැකිය හැකිය. එබැවින් ඉන්දියාවට නිමක් නැති සෘතු වැඩෙන භූමිය (The land of the endless growing seasons) යැයි විරුදාවලියක් ද පවතී. කාලිදාසයන්ගේ සෘතු සංහාරම් කෘතියෙහි භාරත දේශයේ කැපී පෙනෙන සෘතු හයක් වර්ණනා කර ඇත. එනම් ග්‍රීස්ම (මැයි-ජූනි), වර්ෂා (ජූලි-අගෝස්තු), සරත් (සැප්තැම්බර්-ඔක්තෝබර්), හේමන්ත (නොවැම්බර්-දෙසැම්බර්), සිසිර (ජනවාරි-පෙබරවාරි) සහ වසන්ත (මාර්තු-අප්‍රේල්) වශයෙනි. නූතන දේශගුණික වර්ගිකරණයන්ට අනුව මජිඩ් හුසේන් (Majid Husain 2013) දක්වන පරිදි ඉන්දියාවේ කැපී පෙනෙන සෘතු හතරක් තිබේ. එනම් ශීත,

උෂ්ණ, වර්ෂා (මෝසම්) සහ ශරත් හෙවත් පශ්චාද් මෝසම් වශයෙනි. වර්ෂා ඍතුව ජුනි සිට සැප්තැම්බර් දක්වා පවතී. පෘථිවි තලයේ පවතින වඩාත්ම තෙත් ඍතුව වශයෙන් සැලකෙන මෙම කාලය ඉහළ වර්ෂාපතනයක් වාර්තා වන කාලයයි. උතුරු ඉන්දියානු ප්‍රදේශයේ ඇතිවන අඩු පීඩන තත්වය හා ඉන්දියන් සාගරය හරහා හමා එන තෙත් උණුසුම් මෝසම් සුළං හේතුවෙන් ඉන්දියානු අර්ධද්වීපයට අධික වර්ෂාපතනයක් ලැබෙන මෙම ඍතුව සමස්ත ඉන්දියාවේ ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී කාලය ලෙස සැලකේ .

බුදුරජාණන් වහන්සේ වස් එළඹුම සඳහා අනුදැන වදාරන්නේ මෙම මෝසම් ඍතුව හෙවත් වස්සාන සමයයි. වස්සාන ඍතුව යනු දැඩි වර්ෂාව සහ ශීතල පවතින සමයකි. වස්සානයේ ඇතිවන ශීතල ඍතු විපර්යාසය නිසාම සිදුවන්නක් බව චතුක්ක නිපාතයේ සමචිත්ත වර්ණනාවේ දැක්වෙයි (*වස්සානෙ ච හෙමන්තෙ ච සීතං හෝති. තං උතු සමුට්ඨානමෙව*). මෙසේ අධික වැසි සහිත ශිතල දේශගුණයක් ඇති වස්සාන සමයේ කුරුල්ලන් හා සිවුපාවුන් වැනි සත්තු එක් තැන්ව සිටිති. ගැඩවිල්ලන්, පැතලි පණුවන් (කුඩැල්ලන් වැනි), මොලුස්කාවුන් (ගොළුබෙල්ලන් වැනි) ආදී තෙත් පරිසරයට වඩාත් රුචි සත්තු පෙළොවෙන් මතු වී නිදහසේ සැරි සරති. වැඩි ජල ප්‍රමාණයක් සහිත පැලෑටි අනුභවයට රුචි වූද පිනිබිඳු පානය කරන්නාවූද සිරුරට ජලය උරා ගැනීමට හැකි වූද කුඩා අනු කුඩා සත්තු නිදහසේ සැරි සරති. විවිධ තෘණ වර්ග සදාහරිත පැහැය ගනිමින් වැඩෙයි. විවිධ ඍතුවල දී පරිසරයේ සිදුවන අපූර්ව වෙනස්කම් චමත්කාර ජනක ලෙස වර්ණනා කරන කාලිදාසයන් සිය ඍතුසංහාරම් කාව්‍ය නිර්මාණයේ දෙවන සර්ගය මගින් වර්ෂා ඍතුවෙහි දැකිය හැකි වෙනස්කම් කෘතහස්ත පරිසර විද්‍යාඥයකු මෙන් ඉදිරිපත් කර ඇත. ඔහුට අනුව වර්ෂා කාලය යනු රජකුගේ සම්ප්‍රාප්තිය වැන්න. ඇත් මුව ආදී සිවුපාවෝද කැදැති මොණර ආදී පක්ෂීහුද මැඩියන් ආදී ජලජ සත්ත්වයෝද මීමැසි බමර ආදීහුද වර්ෂා ඍතුවත් සමග ප්‍රබෝධමත්ව ප්‍රජනන කාර්යය සඳහා උත්තේජනයක් ලබති. තණ පඳුරු, වෘක්ෂලතා හරිත පැහැයෙන් ජීවය ලබයි. වැසි මගින් පිරී ඉතිරී යන ගංගාවෝ දෙගොඩතලා ගොස් පොළව සශ්‍රීක කරති. මිදෙල්ල, මුරුත, කුඹුක්, බක්මී, දොඹ, වැටකේ ආදියෙන් සපිරි වනය මලින් සුවඳවත් වෙයි. ලැව්ගිනි ආදී උපද්‍රවයන්ගෙන් තොරව පරිසරය ප්‍රබෝධමත් වී සියලු ප්‍රාණීන්ට ජීවය ලබා දෙයි. වස්සාන ඍතුවත්



සමග සොබා දහමේ ඇතිවන මේ අපූර්ව වෙනස් වීමට බාධා නොකර මනුෂ්‍යයන් එක් තැන්ව සිටීමේ වැදගත්කම අවධාරණය කරමින් බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට වස් එළඹුම අනුදැන වදාළහ. සොබා දහමට අවනත වෙමින් ක්‍රියා කිරීමේ විනය ප්‍රතිපදාවක් වශයෙන් ඉදිරිපත් වූ මෙම වස් සමාදානය තුළින් පිළිබිඹු වන පාරිසරික හා සමාජීය වැදගත්කම කුමක්ද යන්න කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම වටී.

ඉහත දැක් වූ පරිදි වැසි සමයේ ස්වාභාවික පරිසරයේ සිදුවන වෙනසට සමගාමීව මානව කටයුතු හා චර්යාවන්හි ද වෙනස්කම් සිදුවෙයි. එකල භාරතීය ජනයා වැසි සමය එළඹීමට මත්තෙන් අස්වනු කපා පාගා ගබඩා කර තැබීමටත් දෙනුන්ගෙන් කිරි දොවා කල් තබා ගත හැකි පරිදි සකසා තැබීමටත්, සෙසු ආහාර පාන රැස් කර තබා ගැනීමටත්, වැසි කලත් සමග එන ශීතලෙන් මිදෙනු පිණිස උඳුන් සඳහා ඇවැසි දර දස් කර තබා ගැනීමටත් උත්සුක වූහ. වස්සාන සමය එළඹෙත්ම අඹුදරුවන් සමග කා බී විනෝද වෙමින් කම් සැපයෙහි ඇලී ගැලී සිටීමට ඔවුහු පුරුදුව සිටියහ. බෞද්ධ සාහිත්‍යයේ එන විවිධ අවස්ථා මගින් පැහැදිලි වන ආකාරයට සවාමි භාර්යා සහවාසයේ කූට ප්‍රාප්තිය සිදුවන්නේත් එහි ප්‍රතිඵල වශයෙන් දරු ඵල නිමිති පහළ වන්නේත් වස්සාන සමය තුළය. සිදුහත් රාහුල කුමාරෝත්පත්තීන් මෙය තවදුරටත් තහවුරු කර දක්වයි. වර්ෂා ඍතුවේ දී සොබා දහමේ සිදුවන අපූර්ව වෙනස්කම් වර්ණනා කළ කාලිදාසයන් ද එම අපූර්ව වෙනසින් මුසපත්වන මනුෂ්‍යයෝද කාමයෙන් උද්දීපනය වන ආකාරය වර්ණනා කරයි. සූත්ත නිපාතයේ ධනිය සූත්‍රයේ දැක්වෙන පරිදි බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙක මහා මහී ගංතෙර විසූ ධනිය ගෝපාල වැසි සමයට පෙර සියලු කටයුතු නිමවා ගංතෙරට වී උදම් අනනු උන් වහන්සේට ඇසිණි. එම උදානයෙන් ප්‍රකාශ වූයේ තමන් අටු කොටු වල ධාන්‍ය පුරවා, කිරි ආහාර සකසා, නිවහන් උණුසුම් කර ඇති බැවින් වැස්ස වළාහක දෙවියන්ට ඇති තරම් වහින ලෙස ඉල්ලා සිටීමය. බුදුරජාණන් වහන්සේ ධනිය ගෝපාලට දුන් උපදේශයෙන් වස්සාන සමයේදී ගිහියන්ගේ කාර්යභාරය කෙබඳු විය යුතු ද යන්න මනාව පැහැදිලි වෙයි. ධනිය ගෝපාලලාගේ ප්‍රතිපදාවට අනුව නිවස තුළට වී ඍතුව නිමාවන තෙක් පස්කම් සැපයෙහි ඇලී ගැලී සිටීමෙන් තෘෂ්ණාව වැඩෙයි. ආධ්‍යාත්මය පිරිහෙයි. සසර ගමන දිගු වෙයි. සිත තව තවත්

ලාමක හැසිරීම්වලට ගිජු වෙයි. එබැවින් මේ කාලය තුළ එයින් මිදී ආධ්‍යාත්මික දියුණුව ලබන්නට වෙර දැරිය යුතු බවත් ඊට කදිම අවස්ථාවක් භික්ෂු සංඝයා වස් සමාදන්වීමෙන් ලැබෙන බවත් එයින් ගම්‍ය වෙයි.

වස් එළඹුමෙන් පසු භික්ෂු සංඝයාටත් විවේක සුවයෙන් භාවනානුයෝගීව කටයුතු කරන්නටත් එතුළින් ධර්මඥානය ප්‍රගුණ කරන්නටත් අවස්ථාව සැලසෙයි. තම සසර ගමන කෙටි කර ගන්නට ප්‍රාර්ථනා කරන ගිහි පාර්ශවයට මෙය ඉතා වටිනා අවස්ථාවකි. ශීල සමාධ්‍යා දී ගුණයෙන් වැඩෙන එම උත්තමයන් වහන්සේලාට සිවුපසයෙන් උපස්ථාන කරමින් පින් රැස් කර ගන්නට ඔවුනට අවස්ථාව සැලසෙයි. අනෙක් අතට ධර්මශ්‍රවණය හා ධර්ම සාකච්ඡා තුළින් ධර්මය ප්‍රගුණ කරන්නට අවස්ථාව උදා වෙයි. එබැවින් වස්සාන සමය වූ කලී පැවිදි ගිහි දෙපාර්ශවයට ම ලෝකෝත්තර සුවය සලසා ගන්නට මග පාදන සමයෙකි. මෙම තත්වය වර්තමාන ශාසන සම්ප්‍රදායට ගලපා බැලීමේදී ද එම පැවිදි ගිහි සම්බන්ධතාව ශක්තිමත් කර ගරනීමේ ඉතා වටිනා අවස්ථාවක් වස් සමාදානයෙන් උදාවන බැව් පෙනේ. නිතරම භික්ෂූන් වහන්සේ විහාරස්ථානයේ වැඩ සිටීමෙන් දායක කාරකාදීන් සමග සම්බන්ධවීමට ඇති ඉඩ ප්‍රස්තා සුලබ වෙයි. ඔවුන්ගේ දුක සැප විමසා බලන්නටත් විවිධ ගැටළුවලදී ධර්මානුකූල උපදේශනය තුළින් පිහිට වන්නටත් අවස්ථාව ලැබෙයි. විහාරස්ථානයේ සංවර්ධන කටයුතු සිදු කරන්නටත් මෙය ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් වෙයි. දායක පක්ෂයට ද නිතර නිතර විහාරස්ථානයට පැමිණීමටත් එහි කුඩු මහත් කටයුතු විමසා බලන්නටත් අවස්ථාව සැලසෙයි. විවිධ ආකාරයේ පිංකම් සංවිධානය කිරීම මගින් ගොඩුරු ගම්හි ප්‍රජාව අතරද එකමුතු බව හා සමගිය වැඩෙන්නට වස්සාන සමය ඉවහල් වෙයි.

බුදුරජාණන් වහන්සේ කිසි විටෙකත් පවතින සමාජ සංස්කෘතික දේහයෙන් වියුත්පන්න වූ ආකස්මික දර්ශනයක් ඉදිරිපත් කළේ නැත. එබඳු පසුබිමක් උදෙසා සිය ශ්‍රාවකයන් මෙහෙය වූයේ ද නැත. එකල භාරතීය සමාජය තුළ මුල් බැසගෙන පැවැති ඇතැම් සංකල්ප හා සම්ප්‍රදායන් තම දේශනාවලට සම්බන්ධ කර ගනිමින් ඒවා තථාගත දේශනාවට අනුකූල වන පරිද්දෙන් වඩාත් අර්ථ සම්පන්න ලෙස ඉදිරිපත් කිරීමට උන්වහන්සේ උනන්දු වූහ. බ්‍රාහ්මණ සම්ප්‍රදාය



තුළ පැවැති බලි පූජාව නව අරුතකින් පංචබලි සංකල්පයකින් දැක්වීමත්, සදිසා නමස්කාරය ඉතා වටිනා යුතුකම් හා වගකීම් සමුදායක් තුළ ප්‍රති නිර්මාණය කිරීමත් එයට සාක්ෂි සපයයි. සිය ශ්‍රාවක සංඝයා වෙත වස් සමාදන්වීම අනුදැනීම තුළින් මතුව එන්නේද එම පරමාදර්ශයයි. අන් මතවලට ගරු කිරීමත්, සමාජ සම්මතයන්ට පිටු නොපා ක්‍රියා කිරීමත්, දේශයට ගැළපෙන පරිදි පරිසර හිතකාමී විහරණයක වැදගත්කමත් වස් සමාදන්වීම තුළින් බුදුරජාණන් වහන්සේ ප්‍රකට කළහ. උන්වහන්සේ පරිසරයේ ඇති සුන්දරත්වය වර්ණනා කළහ. පාරිසරික උපමා තුළින් ගැඹුරු ධර්මය සරල කොට ඉගැන්වූහ. ඇතැම් අවස්ථාවන්හි දී උන්වහන්සේ වස් කාලය ගත කළේ භේසකලා, පාරිලෙය්‍ය, චාලිය ආදී වනාන්තරවලය. සිත පහන් කරවන වේළුවනය, මිගදාය, විසල්පුර වනය, කිඹුල්වත් මහ වනය ආදී පරිසරයේ අපූර්ව ස්ථාන ධර්ම දේශනා සඳහා තෝරා ගත්තේ එහි වටිනාකම සිය ශ්‍රාවකයනට අත් විඳින්නට සැලැස්වීමෙනි. පරිසර සංරක්ෂණය හා සෘජුවම සම්බන්ධ වන විනය නීති බොහොමයක් සිය ශ්‍රාවකයන් වෙත සම්ප්‍රේෂණය කරන්නට උන්වහන්සේ උත්සාහ ගත්හ. මෙම පසුබිම තුළ වස් සමාදානයේ ඇති ඉතා වටිනා අරුතක් මතු වී එයි. එනම් බුදු සමයෙන් ප්‍රගුණ කෙරෙන පරිසර හිතකාමී සංකල්පනා තුළින් සමාජ ප්‍රතිමානයන් (social norms) සමූහයකට පදනම වැටීමයි.

## වස් සමාදානය ඔස්සේ පරිසර සංරක්ෂණය උදෙසා සමාජ ප්‍රතිමාන ප්‍රවර්ධනය කිරීම

ඉහත දී සාකච්ඡා කළ පරිදි වස් සමාදානය හා බැඳුණු ඉතා ප්‍රබල පාරිසරික හා සමාජ දර්ශනයක් තිබේ. භූගෝලීය හා සමාජ පරිසරයේ සිදුවන වෙනස්වීම් කෙරෙහි සාවධාන වීමේ වැදගත්කම පිළිබඳ පණිවිඩය බුදුරජාණන් වහන්සේ වස් සමාදානය අනුදැන වැදෑරීමෙන් ගම්‍ය වෙයි. පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය තුළින් පරිසර හිතකාමී සංකල්පනා වර්ධනය කිරීමටත් එමගින් සමාජ ප්‍රතිමාන ගොඩ නැංවීමටත් වස්සාන සමය යොදා ගත හැකි ද? වර්තමානයේ අප අත් විඳින විවිධ පාරිසරික ගැටලු විසඳීම පිණිස එමගින් ප්‍රවේශයක් ලබා ගන්නේ කෙසේද? පරිසරය සුරැකීමෙහිලා භාවිතයට ගත හැකි සමාජ ප්‍රතිමාන වස් සමාදානය සමග ගලපන්නේ

කෙසේද යන්න අවධානය යොමු කිරීම අනාගත පර්යේෂණයන්හි දී වඩාත් අවධානයට යොමු විය යුතු කාලෝචිත තේමාවකි.

සොබා දහම සහ මිනිසා අතර ඇත්තේ අවියෝජනීය බැඳීමකි. මේ බැඳීම තිර කරන ප්‍රබල සාධකයක් වන්නේ ආගමයි. සොබා දහමත් ආගමත් මිනිසාත් අතර ගොඩනැගුණු අන්‍යෝන්‍ය සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් ශිෂ්ට සම්පන්න සමාජ බිහිවූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. පරිසර හිතකාමී සමාජ ප්‍රතිමානයන් බිහිවන්නේ මේ අපූර්ව සම්බන්ධතාවන්හි ප්‍රතිඵලයක් වශයෙනි. ෂෙරිෆ් (Sheriff 1936) දක්වන පරිදි ප්‍රතිමානයන් යනු වටිනාකම්, සිරිත් විරිත්, සම්ප්‍රදායන් සහ හර පද්ධතීන් ආදියේ එකතුවෙන් සුසැදි සංස්කෘතික මෙවලමකි. එය සමාජය තුළ පුද්ගලයකුගේ හැසිරීම මෙහෙයවනු ලබන අවිධිමත් අවබෝධය යි. පුද්ගලයකුගේ සංජානනය හා චර්යාව සමග එය බැඳී තිබේ. කොලිමන් ට අනුව (Coleman 1987) ප්‍රතිමාන යනු සමාජ පද්ධතිය ගොඩනැගීමේ ගාමක බලයයි. එය සමාජ පාලන කාරකයක් මෙන් ම සමාජ වත්කමකි. එය සමාජ ප්‍රතිමාන බවට පත්වන්නේ විවිධ විශ්වාස, ආකල්ප, වටිනාකම් සහ චර්යාවන් පදනම් කරගෙන කිසියම් සමාජයක් තුළ ජීවත්වන සාමාජිකයන් අතර දිගු කාලයක් පුරා ගොඩනැගෙන චර්යාත්මක අපේක්ෂා සහ ඉගි සමුදාය පදනම් වීමෙනි. තවත් ලෙසකින් කිවහොත් සමාජ ප්‍රතිමාන යනු බාහිර පරිසරය සමග සබඳතා පවත්වාගැනීමෙහිලා උපකාරී වන කිසියම් ජන සමූහයක් විසින් පිළිගන්නා චාරිත්‍රානුකූල චර්යාත්මක නීති හෝ සම්මුතීන් ය. ඒවා ගොඩනැගෙන්නේ ආර්ථික සමාජ දේශපාලනික සංස්කෘතික හෝ පාරිසරික අභිලාෂයන් පෙරටු කරගෙන ය. කිසියම් සමාජයක් ජීව අජීව පරිසරය විෂයෙහි ක්‍රියාකරන්නේ කෙසේද යන්න පිළිබඳ මග පෙන්වීමක් සමාජ ප්‍රතිමාන මගින් සැපයේ. ජීව අජීව පරිසරය පිළිබඳ ව හිතානුකම්පී ආකල්ප වර්ධනය වීම තුළින් පරිසර හිතකාමී ප්‍රතිමාන බිහිවෙයි. බෞද්ධ ප්‍රතිපදාව අනුව පුද්ගලයා තම අවට පරිසරය දෙස බැලිය යුත්තේ මෛත්‍රී පූර්වංගම සන්සුන් මනසකිනි. මිතුරු සිතිවිල්ලෙනි. දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේ දැක්වෙන පරිදි ගසක සෙවන ලබන්නකු එහි අතු බිඳ දමන්නේ නම් ඔහු මිත්‍ර ද්‍රෝහියෙකි.

යස්ස රුක්ඛස්ස ඡායාය - නිසීදෙය්‍ය සයෙය්‍යවා
න තස්ස සාඛං භංජෙය්‍ය - මිත්ත දූබ්භොහි පාපකො



ස්වාභාවික පරිසරය සමග අන්තර් සබඳතා පවත්වා ගැනීමේ දී විවිධ සමාජයන් අනුගමනය කරනු ලබන ප්‍රතිමානයන් විවිධ වෙයි. එහෙත් වර්තමානයේ උද්ගත වී ඇති පාරිසරික ගැටළුවලට පිළියම් සෙවීමේ දී පරිසර හිතකාමී ප්‍රතිමාන අත්‍යවශ්‍ය වී තිබේ. දිනෙන් දින උග්‍ර වන ගෝලීය පාරිසරික විපත් හමුවේ මානව සංහතිය වර්තමානය වනවිට මුහුණපා ඇත්තේ දැඩි අර්බුදයකටය. ලෝකයේ සාමකාමී වටපිටාවට එය බෙහෙවින් තර්ජනයක් වී තිබේ. නොබෙල් සම්මානලාභී අන්තර් රාජ්‍ය කමිටුවේ උපකල්පනයන්ට අනුව එළඹෙන සියවස තුළ ලෝකය පුරා විවිධ පාරිසරික විපත් උත්සන්න වනු ඇත. ඒ හේතුවෙන් ඇතිවන උග්‍ර ආහාර අර්බුද හා වසංගත රෝග මානව සංහතිය දැඩි අර්බුදයක ගිල්වනු ඇත. දැනටමත් ඉතිහාසයේ කවරදාක හෝ නැසූ විරූ පමණට ස්වාභාවික විපත් වර්ධනය වෙමින් පවතින බවට ලොව පුරා නිදසුන් බොහෝය. මෙකී තත්වයන් සමනය කිරීමේ දී එහිදී පංචශීල ප්‍රතිපදාව, ආර්ය අෂ්ඨාංගික මාර්ගය, සක්විති වත් ආදී බෞද්ධ සංකල්ප බෙහෙවින් භාවිතයට ගැනීමේ හැකියාවක් ඇති බව අරවින්ද් සිං (Aravind Singh 2010) පවසයි. විද්‍යාත්මක දැනුම සැපයීමෙන් නොව ආධ්‍යාත්මික ශික්ෂණය මගින් වඩාත් ඵලදායී පරිසර හිතකාමී ප්‍රතිමාන වර්ධනය කළ හැකි බව ඔහුගේ මතයයි. රොබට් වයිට් (Robert A White 1995) සඳහන් කරන්නේ පාරිසරික වශයෙන් තිරසර සමාජයක් ගොඩනැංවීමෙහිලා බුදුදහමේ ඉගැන්වෙන ආධ්‍යාත්මික පදනම බෙහෙවින් ඉවහල් වන බවයි. තම ජීවිතයට මෙන් ම සොබා දහමට ද ගරු කළ යුතුය. ජීවීන් අතර පවත්නා අන්‍යෝන්‍ය සබඳතාව හඳුනා ගැනීමට අල්පේච්ඡතාව අගයන අයකුට ඉතා පහසුය. එබඳු ප්‍රතිමානයන්ගෙන් සැලසෙන වැදගත්ම ප්‍රයෝජනය වන්නේ හිමිකාරීත්වයක් නොලබා පරිසරයේ ප්‍රතිලාභ ලබමින් සතුටු විය හැකි වීමයි. ඒ අනුව වස් සමාදන්වීමට පසුබිම්වන හේතු සාධක පිරික්සීමේදීත් වස් සමාදන්වීම හා බැඳෙන විවිධ ආගමික වත් පිළිවෙත් සළකා බැලීමේදීත් පරිසර හිතකාමී ප්‍රවේශය යළි යළිත් තහවුරු වෙයි. මේ ඇසුරින් සමාජයක් තුළ හටගන්නා ආකල්පමය වෙනස සාධනීය එකකි. එය ආගමික වශයෙන් ඇති කරන එකගකම හෝ සමාධිය හා බැඳෙන අතර පරිසර හිතකාමී ප්‍රතිමාන ප්‍රවර්ධනය කිරීමට ඉවහල් කරගත හැකිය.

පරිසර සංරක්‍ෂණය හා සෘජුව ම සම්බන්ධ වන විනය නීති බොහොමයක් විනය දේශනාවල දක්වේ. ඒවා භික්‍ෂු භික්‍ෂුණීන් සඳහා පනවා තිබුණ ද සැබැවින් ම ඒවා සමස්ත මානව වර්ගයාට ම පොදු වූ පරිසර හිතකාමී සමාජ ප්‍රතිමානයන් ය. ගිලන් වූ අයකු උදෙසා මිස නිකරුණේ ගසක කොල, පොතු හා ගෙඩි කැඩීම ඇවතක් බව විනය දේශනාවේ දක්වෙයි. මෙය වනාහී පරිසර සංරක්‍ෂණය සඳහා භාවිතයට ගත හැකි ප්‍රතිමානයකි. නිකරුණේ කැළෑ ගිනි තැබීමද, රෝගියකුගේ අවශ්‍යතාවකට හැර ගිනිගොඩවල් ගසා වාතයට දුම් රොටු එකතු කිරීම ද වරදකි. නිරෝගී අයකු ජලයට අප ද්‍රව්‍ය බැහැර කරන්නේ නම් එයද වරදකි. අනෙකක් තබා බොන දිය සමීපයෙහි ඇති සෙනසුන් පිරිසිදු කිරීමේ දී ජලයට දූලි අංශු එකතු නොවන පරිදි එය සිදුකළ යුතු බව විනය දේශනාවන්හි ඉගැන්වෙයි. මෙයින් මතුව පෙනෙන්නේ රෝගියකුට හැර අන් කවර තරා තිරමක අයකුටවත් කෙතරම් පූජනීය කටයුත්තක් උදෙසා වුවත් පරිසරයට හානිකර ලෙස කටයුතු කිරීමට බුදුදහමින් අවසරයක් දී නොමැති බවයි. කෙතරම් දුරට සිය ශ්‍රාවකයන්ට පරිසර හිතකාමී ලෙස සිතන්නටත් ඒ අනුව ක්‍රියා කරන්නටත් බුදුරජාණන් වහන්සේ මග පෙන්වූයේද කිවහොත් පන්සලක් ඉදිකිරීමේදී එය ඉදිකිරීමට අපේක්‍ෂිත භූමිය පිළිබඳ ව ප්‍රථමයෙන් ම පාරිසරික ඇගයීමක් සිදු කරන්නට උපදෙස් දී තිබේ. එනම් එම භූමි භාගය අවට වේයන්, සර්පයන් වසන තුඹස් වේද, සිංහ වලස් දිවි ආදී සිවුපාවුන් වසන තැනක් ද, හාල් උඳු මුං ආදී ධාන්‍ය වගා කරන වගා බිමක් ද සොහොන් බිමක්ද උයනක්ද ඇත් අස් හලක්ද අවන්හලක්ද මාර්ගයක්ද සිව්මංසලක් ද ඒවාට ගමන් කරන මාර්ග අවහිර වේද යනාදී කරුණු විමසා බලා විහාර කර්මාන්තයක් සිදු කලයුතු බවත් එසේ නොකළහොත් සංඝාදිසේස ඇවැතක් බවත් විනය දේශනාවල දක්වේ.

ඉහත කී පරිසර හිතකාමී ප්‍රතිමාන තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට වස්සාන සමය භාවිතයට ගත හැකිය. වසරකට වරක් එළඹෙන වස් සාරමාසය ක්‍රියාකාරී අවධිය ලෙසත් වසරේ සෙසු කාල පරිච්ඡේදය සැළසුම් අවධිය ලෙසත් සලකා එකී අවධීන්වල දී අනුගමනය කළ හැකි විවිධ ක්‍රමෝපායන් මගින් පරිසර හිතකාමී ප්‍රතිමාන ප්‍රවර්ධනය කළ හැකිය. උදාහරණයක් වශයෙන් වස් සමාදන්වීමේ සිට කඨින පිංකම් අවසන් වන කාලය දක්වා ක්‍රියාකාරී



අවධිය තුළ ගිහි පැවිදි දෙපාර්ශවයේ සහභාගිත්වයෙන් මතු දක්වෙන කටයුතුවලට එළඹිය හැකිය.

- වස් ආරාධනා කිරීමේ පිංකමේ දී වස් සමාදානයේ විනයානුකුල හා ආගමික වැදගත්කම පමණක් නොව පුද්ගලයා සහ පරිසරය අතර සංහිඳියාව තහවුරු කිරීමේ වටිනාකම අවබෝධ කරවීම
- වස් කාලය තුළ පවත්වනු ලබන ධර්ම දේශනා සහ විවිධ ආගමික වැඩසටහන්වල දී පරිසර සංරක්‍ෂණයේ වැදගත්කම මතු කරමින් ස්වයං ප්‍රතිඥා පිහිටුවා ගැනීම
- වස් ආරාධනා කළ පාර්ශවය සිවුපසයෙන් උපස්ථාන කිරීම පිණිස එළඹෙන ස්වයං සම්මුතිය මෙන් පරිසර සංරක්‍ෂණය සඳහා ද දෙපාර්ශවයම සම්මුතිගත වී ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම
- පරිසරයට හානිකර ද්‍රව්‍ය පිංකම් සඳහා භාවිතයට ගැනීම අවම කිරීම, පරිසර දූෂණය (ශබ්දය, ජලය, ගොබඩීම සහ වාතය ආදී) නොවන පරිදි වස් කාලය පුරා කටයුතු කිරීමට පැවිදි ගිහි දෙපාර්ශවය ම ක්‍රියා කිරීම

මෙකී පදනම මත පිහිටා වස් කාලය පුරා පෙර දී සකසා ගත් කිසියම් සැලැස්මකට අනුව කැළි කසළ කළමනාකරණය කිරීම, වස් ආරාධනාව සනිටුහන් කරමින් ගෘහ මට්ටමින් රුක් රෝපණය කිරීම, ශ්‍රමදාන මගින් පරිසර පවිත්‍රතා පිංකම් පැවැත්වීම, ප්‍රජා සුභසාධන වැඩසටහන් පැවැත්වීම ආදිය සිදු කළ හැකිය. සැලසුම් අවධිය තුළ සංවිධානය වීම, දැනුවත් කිරීම, ක්‍රියාකාරී සැලසුම් සැකසීම මෙන් ම පෙර සූදානම් වීම ආදී ක්‍රියාකාරකම් කළ හැකිය. මෙකී පිරිසර හිතකාමී ප්‍රතිපදාවේ සාර්ථකත්වය පිළිබඳ පසු විපරම් කරමින් සෑම වසරක් පාසා ම ක්‍රියාවට නැංවීම තුළින් යහපත් ප්‍රතිඵල අත්කර ගැනීමට හැකිවනු ඇත. පරිසරය සුරැකීමේ නාමයෙන් වස් කාලයෙහි රෝපණය කරන ලද ශාකයන්හි මල් ඵල ඖෂධ ඉදිරි වස් පිංකමකදී භාවිතයට ගැනීමේ අධිෂ්ඨානය සඵල වනු ඇත. කෙටි කලක් ඇතුලත හරිත පැහැයෙන් පිරි සුපිරිසිදු පරිසරයක එක්වන්ව එක් සිත්ව මිනිසුන් වසන බිමක වස් සමාදානයටත් කඨින පිංකම් පැවැත්වීමටත් හැකිවනු ඇත. නිසි ලෙස මෙකී සංකල්පය භාවිතයට ගතහොත් එය ලෝකවාසී

බෞද්ධ ජනතාව ම අනුගමනය කරන ප්‍රතිපදාවක් බවට පත් කළ හැකිය. වස්සාන සමය ඇරඹීමත් සමග වෙනදාට වඩා පරිසරය වෙනුවෙන් සිය ජීවිත කැප කරන්නාවූත් ආගමික වශයෙන් පේ වී ක්‍රියා කරන්නාවූත් සමය උදාවූ බව බවට හැඟී යන සිතිවිලි බොදු සිත් සතන් තුළට කා වැදීම තුළින් පරිසර හිතකාමී ප්‍රතිමාන ප්‍රවර්ධනය වන අතරම එය සමස්ත සමාජ දේහයටම සම්ප්‍රේෂණය කිරීමේ දිගු කාලීන ක්‍රමෝපායන් පිළිබඳ ව තවදුරටත් අධ්‍යයනය කළ යුතුය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

*ප්‍රාථමික මූලාශ්‍රය*

පෙතවත්ථු, 52 පිටුව, බු.ජ.මු.
පාචිත්තියපාලි, භික්ඛු විභංග, 554 පිටුව, බු. ජ. මු.
චුල්ලවග්ග පාලි II, වත්තක්ඛන්ධක, 364 පිටුව, බු. ජ. මු.
මහා වග්ග පාලි, වස්සූපනායිකක්ඛන්ධක, 346-348 පිටු, බු. ජ. මු.
සුත්ත නිපාත I, ධනිය සුත්ත, 246 පිටුව, බු. ජ. මු.
දීඝ නිකාය I, කූටදන්ත සුත්ත, 248-322, බු. ජ. මු.

*ද්විතීයික මූලාශ්‍රය*

චන්ද්‍රසෝම හිමි, කණුමුල්දෙණියේ (2012), කාලිදාසගේ ඍතුසංහාරම්, ඇස්. ගොඩගේ හා සහෝදරයෝ, කොළඹ.

දිසානායක, එම්. (2005), ලොව මහා ගංගා, වාසනා ප්‍රකාශකයෝ, දංකොටුව.

බෂාම්. ඒ.එල්. (1962), අසිරිමත් ඉන්දියාව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ.

සංඝසුමන හිමි, පින්නවල (2014), සමාජ සමීක්ෂා: පුවත්පත් ලිපි එකතුව, කර්තෘ ප්‍රකාශන.



Husain, M. (2013), Geography of India, McGraw Hill Education Limited, New Delhi.

Singh, A.K. (2010), Global Concern to Climate Change: A Buddhist Perspective, In: Global Rcovery: Buddhist Perspective, UNDV Conference Volume, 14-23pp.

White, R.A. (1995), Spiritïl foundation of an Ecological Sustainable Society, The Journal of Buddhist Studies, Vol. 7.2, 47-74pp.

Intergovernmental Panel on Climate Change, Available at http:.//www.ipcc.ch/organization/organization.shtml, Retreaved on 26.07.2015